## 17. ධ්‍යාන ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

ද්විපඤ්ච විඥානයෙන් අන්‍ය වූ සිත් එකුන් අසූවෙහි ඇත්තාවූ විතක්ක විචාර පීති වේදනා ඒකග්ගතා යන ධ්‍යානාංග ධර්මයෝ ධ්‍යාන ප්‍රත්‍ය ධර්මයෝ ය.

ද්විපඤ්ච විඥානයෙන් අන්‍යවූ සිත් එකුන් අසූවය, චෛතසික දෙපනසය, චිත්තජ රූපය, ප්‍රතිසන්ධි කර්මජ රූපය යන මොහු ධ්‍යාන ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ද්විපඤ්ච විඥාන දසයය, සර්වචිත්ත සාධාරණ චෛතසික සතය, බාහිර රූපය, ආහාරජ රූපය, සෘතුජ රූපය, අසංඥ සත්ත්ව කර්මජ රූපය, ප්‍රවෘත්ති කර්මජ රූපය යන මොහු ධ්‍යාන ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**ඣානපච්චයො -** ඣායති උපනිඣායති - අරමුණ කරා එළඹ බලයි, ඉති - එහෙයින්, ඣානං - ධ්‍යාන නම් වේ. ‘ඣායති’ පදය ‘උපනිජ්ඣායති’ පදයෙන් විවරණය කරන තැනදී ‘උප’ ශබ්දය සමීපයට පැමිණ, සම්බන්ධව බලන්නා වූ යන අර්ථය දක්වයි. එබැවින් රූපාවචර සිත්වල දක්වූ ආකාරයට විතර්ක, විචාර, ප්‍රීති, වේදනා යන චෛතසිකයන් තමාට අදාළ වන්නා වූ කෘත්‍යය කරගැනීමට ශක්තිය  ලබා දෙන බැවින් ඒකාග්‍රතාව ආරම්මණයක සමීපයට පැමිණෙන්නාක් මෙන්, සම්බන්ධ කරන්නාක් මෙන් ශාන්තව මනාව අරමුණු කිරීම “උපනිජ්ඣාන - අරමුණ කරා එළඹ බලයි” යැයි කියනු ලැබේ. ඒ ආකාරයට එළඹ බලන්නා වූ ශක්තිය ඣාන ශක්තිය නම් වේ. මෙම උපනිජ්ඣාන ශක්තියෙන් එළඹ බලනා විටදී ආරම්මණයන් මනාව ප්‍රකට වන බැවින් අනුටීකාවේදී “උපනිජ්ඣායන්ති - ‘උපනිජ්ඣායන්ති’ යනු, උපනිකච්ච - එළඹ, නිජ්ඣානඣානරමණස්ස - බලන්නා වූ අරමුණ, ඤාණචක්ඛුනා - ධ්‍යාන ඇසින්, බ්‍යත්තරං - විශේෂයෙන්, ඔලොකනං - බැලීම යි” යැයි විවරණය කරනා ලදී.

පූර්වාචාර්යයන් වහන්සේලා මෙම ධ්‍යාන ශක්තිය ගස් මුදුනකට හෝ කඳු මුදුනකට නැගි පුරුෂයෙකුට උපමා කළහ.  ගස් මුදුනකට හෝ කඳු මුදුනකට නැගි පුරුෂයෙක්ට ඒ මේ අත ඇති විශේෂ දෑ තමන්ට ම දැක ගත හැක. තමා දකින්නා වූ සියළු දේ අන්‍යයන්ට පැවසීමට ද හැක. එමෙන් ම විතර්කාදී ධ්‍යානංගයන් තමා විසින් එළඹ බලනු ලබයි. සහජාත ධර්මයන්ට ද තමා දකින්නාක් මෙන් එළඹ බැලීම සඳහා ධ්‍යාන ශක්තියෙන් උපකාර ලැබේ. නිවැරදිය - විතර්කාදීන්ගේ උපකාරයෙන් එක් ආරම්මණයක් මත්තෙහි

ඒකාග්‍රතාව උපදනා අවස්ථාවකදී සම්ප්‍රයුක්ත ධර්මයෝ ද ඒ අරමුණට එළඹ අරමුණු කරති.

**ප්‍රත්‍ය - ප්‍රත්‍යෝත්පන්න -**

- ලෝභ මූල ප්‍රථම සිත, චෛතසික හා චිත්තජරූපයන් එක්ව උපදනා තැනකදී විතර්කය ප්‍රත්‍යය වේ. විතර්කය හැර සෙසු සිත්, චෛතසික අටළොස සහ චිත්තජ රූප ප්‍රත්‍යයෝත්ප්පන්න වේ. එම ක්‍රමයෙන් විචාරය -පෙ- ප්‍රීතිය -පෙ- ප්‍රත්‍යය වේ -පෙ- ඒකාග්‍රතාව ප්‍රත්‍යය වේ -පෙ- වේදනාව ප්‍රත්‍යය වේ. වේදනාව හැර සෙසු සිත්, චෛතසික අටළොස සහ චිත්තජ රූප ප්‍රත්‍යයෝත්ප්පන්න වේ.
- ප්‍රතිසන්ධි අවස්ථාවේදී ප්‍රතිසන්ධි කර්මජ රූප ප්‍රත්‍යයෝත්ප්පන්නයන්හි ඇතුලත් වේ. මෙම ක්‍රමයට අනුව අර්හත් ඵලය දක්වා දැනගන්න.
- අරූප භූමියෙහි ප්‍රත්‍යයෝත්ප්පන්නයන්හි රූප ඇතුලත් නොවීම පමණක් විශේෂයි.
- ද්විපඤ්ච විඤ්ඤාණයන්හි ධ්‍යානාංග නොලැබීම පිළිබඳව අභිධර්මාර්ථ සංග්‍රහ භාෂා ටීකාවේ සමුච්චය කාණ්ඩයේ දක්වා ඇත.